අභියෝගය වූයේ 2015-2019 අතර පැවති රජය විසින් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීම හරහා ලබාගත් විශාල වාණිජ ණය තොගයයි.

යහපාලන ආණ්ඩුවේ අවසාන කාලයේ දී, මේ ගැටලුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ අවධානයට ද ලක් වී තිබුණි. 2019 ඔක්තෝබර් මාසයේ දී, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ලංකාවේ ආර්ථිකය ගැන පල කළ අංක 19/335 දරන වාර්තාවේ පවසා තිබුණේ, අධික රාජ්‍ය ණය ප්‍රමාණය සහ අඩු විදෙස් සංචිත ප්‍රමාණය හේතුවෙන් ලංකාවේ ආර්ථිකය අහිතකර කම්පනවලට ගොදුරු විය හැකි බවත්, වෙනත් නැඟී එන ආර්ථිකයන් හා සසඳන විට ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව ණය ගෙවීමට වැය වන මුදල් ප්‍රමාණය ඉතා අධික බවත්ය. ශ්‍රී ලංකාව ප්‍රථම වරට ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කරනු ලැබුවේ 2007 මහින්ද රාජපක්ෂ රජය සමයේදීය. ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීම හරහා මුදල් රැස් කිරීමට එවකට රජය තීරණය කළේ මන්ද යන්න සහ මෙම මුදල් යෙදවූ ආකාරය පිළිබඳව 2007 මහ බැංකු වාර්තාවේ දීර්ඝ හා සවිස්තරාත්මක පැහැදිලි කිරීමක් ඇත.

එම පැහැදිලි කිරීමට අනුව, ශ්‍රී ලංකාව පහළ මැදි ආදායම් ලබන රටක් බවට පත්වීමෙන් පසු විවිධ ජාත්‍යන්තර ණය දෙන ආයතනවලින් සහනදායි මූල්‍ය පහසුකම් ලබාගැනීමට තිබුණු ඉඩකඩ සීමා වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවට මූල්‍ය වෙළෙඳපොළ මත යැපීමට සිදු විය. ජාත්‍යන්තර වෙළෙඳ පොළෙන් වාණිජ ණය ගැනීමේ දී මේ සියල්ල විදේශ විනිමයෙන් ආපසු ගෙවීමට සිදු වන නිසා අතිශය ප්‍රවේසම් විය යුතු බව මහින්ද රාජපක්ෂ ආණ්ඩුව ආරම්භයේ සිටම හොඳින් දැන සිටියේය. තවද, එවැනි ණය ස්වෛරීත්ව බැඳුම්කර හරහා ලබා ගන්නා විට, ණය ආපසු ගෙවීමට නියමිත දිනට මුළු මුදලම එක වර ගෙවීමක් ලෙස ද සිදු කළ යුතුය. මහින්ද රාජපක්ෂ රජය 2007 සිට 2014 අවසානය දක්වා පහත සඳහන් ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කොට තිබුණි.

2007 ඇ.ඩො. මිලියන 500 (වසර 5න් කල්පිරීම)

2009 ඇ.ඩො. මිලියන 500 (වසර 6න් කල්පිරීම)

2010 ඇ.ඩො. මිලියන 1,000 (වසර 10න් කල්පිරීම)

2011 ඇ.ඩො. මිලියන 1,000 (වසර 10න් කල්පිරීම)

2012 ඇ.ඩො. මිලියන 1,000 (වසර 10න් කල්පිරීම)

2014 ඇ.ඩො. මිලියන 1,500 (වසර 5න් කල්පිරීම)

මහින්ද රාජපක්ෂ රජය සමයේ ස්වෛරීත්ව බැඳුම්කර හරහා එකතු කර ගත් මුළු මුදල මේ අනුව ඇමෙරිකානු ඩොලර් මිලියන 5,500කි. මෙයින්, 2007 දී ලබාගත් මිලියන 500ක ස්වෛරීත්ව බැඳුම්කරය 2012 දී ලබා ගත් ස්වෛරීත්ව බැඳුම්කරයේ මුදලින් කොටසක් යොදවා පියවා තිබුණි. මේ අනුව 2014 අවසානය වන විට, ඉතිරිව තිබුණු මුළු ස්වෛරීත්ව බැඳුම්කර ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් මිලියන 5,000ක් විය. (2014 අවසානයේ ලංකාවේ මුළු විදේශ සංචිත ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් මිලියන 8,208ක් විය. ඒ අනුව, මහින්ද රාජපක්ෂ රජය විසින් ලබාගෙන තිබුණු සියලුම ස්වෛරීත්ව බැඳුම්කර ණය එකවර ගෙවා අවසන් කළ ද, විදේශ සංචිතවල ඩොලර් මිලියන 3,200ක් තවදුරටත් ඉතිරිව පවතින බව විද්‍යමාන විය). මහින්ද රාජපක්ෂ ආණ්ඩුවෙන් පසු බලයට පැමිණි 2015-2019 යහපාලන ආණ්ඩුව පහත සඳහන් පරිදි ස්වෛරීත්ව බැඳුම්කර ණය තොගය ඇමෙරිකානු ඩොලර් මිලියන 15,000 දක්වා තුන් ගුණයකින් වැඩි කළේය.

2015 ඇ.ඩො. මිලියන 2,150 (වසර 10න් කල්පිරීම)

2016 ඇ.ඩො. මිලියන 1,000 (වසර 10න් කල්පිරීම)

2016 ඇ.ඩො. මිලියන 500 (අවුරුදු 5.5න් කල්පිරීම)

2017 ඇ.ඩො. මිලියන 1,500 (වසර 10න් කල්පිරීම)

2018 ඇ.ඩො. මිලියන 1,250 (වසර 5න් කල්පිරීම)

2018 ඇ.ඩො. මිලියන 1,250 (වසර 10න් කල්පිරීම)

2019 ඇ.ඩො. මිලියන 1,500 (වසර 5න් කල්පිරීම)

2019 ඇ.ඩො. මිලියන 2,900 (වසර 10න් කල්පිරීම)

2015-2019 රජය විසින් නිකුත් කරන ලද ස්වෛරීත්ව බැඳුම්කර මුළු ප්‍රමාණය මේ අනුව ඇමරිකානු ඩොලර් මිලියන 12,050ක් වේ. (මහින්ද රාජපක්ෂ යුගයේ සිට පවතින ඩොලර් මිලියන 3,000ක ස්වෛරීත්ව බැඳුම්කර සමඟ 2019 අවසානය වන